ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
වයඹ පළාතේ පළාත් සභාව

# පළාත් මූල්‍ය රීති සංග්‍රහය

2008 ජනවාරි මස 01 දින සිට බලාත්මක වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) සහ 20(3) වගන්ති යටතේ
වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
පනවනු ලැබූ පළාත් මූල්‍ය රීති

# පළාත් මූල්‍ය රීති

## පටුන


| | |
|---|---|
| පෙරවදන | v |
| අධිකාර බලය | vi |

| | පරිච්ඡේදය හා ඇතුළත් දෑ | | ආරම්භක පළාත් මූල්‍ය රීතිය | පිටු අංකය |
|---|---|---|---|---|
| I. | **වියදම් හා ආදායම් ඇස්තමේන්තු** | | | |
| | 1 වන කොටස - | වයඹ පළාතේ පළාත් සභා අරමුදල සහ වියදම් සැළසුම් කිරීම හා වැඩසටහන් ගතකිරීම | 1 | 03 |
| | 2 වන කොටස - | වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම | 7 | 16 |
| | 3 වන කොටස - | වාර්ෂික මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | 24 | 32 |
| | 4 වන කොටස - | වියදම් ඇස්තමේන්තුවල වෙනසක් කිරීම | 29 | 35 |
| | 5 වන කොටස - | ආදායම් ඇස්තමේන්තු | 38 | 47 |
| II. | **වියදම් ආපසු ගෙවීම් කපා හැරීම් ආදිය සඳහා අධිකාර බලය** | | | |
| | 1 වන කොටස - | වොරන්ට් බලපත්‍ර හා අග්‍රිම අධිකාර බලය | 43 | 53 |
| | 2 වන කොටස - | පාඩු හා අත්හැර දැමීම් | 51 | 60 |
| | 3 වන කොටස - | විවිධ | 64 | 75 |
| III. | **මූල්‍ය කළමනාකරණ හා උත්තරදායී බව** | | 72 | 81 |
| IV. | **ලැබීම්** | | | |
| | 1 වන කොටස - | මුදල් භාර ගැනීම් | 113 | 121 |
| | 2 වන කොටස - | ආදායම් මුදලින් එකතු කිරීම | 115 | 125 |
| V. | **ගෙවීම්** | | | |
| | 1 වන කොටස - | වගකීම් හා අධිකාර බලය | 130 | 133 |
| | 2 වන කොටස - | වවුචර පිළියෙල කිරීම | 151 | 143 |
| | 3 වන කොටස - | සහතික කිරීම | 169 | 151 |
| | 4 වන කොටස - | වවුචර් වලට ගෙවීම | 175 | 152 |
| | 5 වන කොටස - | නොගෙවූ චේතන | 196 | 161 |
| | 6 වන කොටස - | මාරු ගෙවීම් හා දෙපාර්තමේන්තු අතර ගණුදෙනු | 201 | 163 |

| පරිච්ඡේදය හා ඇතුළත් දෑ | | ආරම්භක පළාත් මූල්‍ය රීතිය | පිටු අංකය |
|---|---|---|---|
| VI. | **පළාත් සභාවේ මුදල් ආදියේ භාරකාර්ත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්** | | |
| 1 වන කොටස - | පළාත් සභාවේ මුදල් ආදියේ භාරකාර්ත්වය හා ආරක්ෂාව | 215 | 167 |
| 2 වන කොටස - | උප පත්‍රිකා පොත් | 236 | 175 |
| 3 වන කොටස - | මුදල් මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල | 244 | 179 |
| 4 වන කොටස - | අග්‍රිම | 256 | 182 |
| 5 වන කොටස - | බැංකු ගිණුම් | 268 | 187 |
| VII. | **ගණන් තැබීම** | | |
| 1 වන කොටස - | පළාත් භාණ්ඩාගාරයේ ගණන් තැබීම හා වගකීම | 294 | 203 |
| 2 වන කොටස - | දෙපාර්තමේන්තුවල පොත්පත් ලේඛණ යනාදිය | 321 | 215 |
| 3 වන කොටස - | කොන්ත්‍රාත් බලපත්‍ර නිකුත් කිරීම යනාදිය සඳහා තැන්පත් කළ යුතු ඇප | 340 | 226 |
| 4 වන කොටස - | විවිධ | 350 | 228 |
| VIII. | **අත්තිකාරම් ගිණුම්** | 365 | 237 |
| IX. | **මුද්‍රණය හා ප්‍රකාශනය** | | |
| 1 වන කොටස - | පොදු කරුණු | 391 | 255 |
| 2 වන කොටස - | මුද්‍රිත ආකෘති පත්‍ර ඇණවුම් | 398 | 256 |
| 3 වන කොටස - | ප්‍රවෘත්ති පත්‍ර නිවේදන හා දැන්වීම් | 406 | 258 |
| X. | **සැපයුම් වැඩ සේවා හා බැහැරකිරීම්** | | |
| 1 වන කොටස - | ප්‍රසම්පාදන | 418 | 263 |
| 2 වන කොටස - | බැහැර කිරීම් හා කුලියට දීම් ලේඛණ යනාදිය | 440 | 277 |
| 3 වන කොටස - | සැපයුම් | 455 | 278 |
| 4 වන කොටස - | භාණ්ඩවල භාරය සහ හර්වැරදි බැලීම් | 470 | 281 |
| 5 වන කොටස - | වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ | 490 | 292 |

| පරිච්ඡේදය හා ඇතුළත් දෑ | | ආරම්භක පළාත් මුල්‍ය රීතිය | පිටු අංකය |
|---|---|---|---|
| **XI. විවිධ කරුණු** | | | |
| 1 වන කොටස - | මුද්දර | 521 | 299 |
| 2 වන කොටස - | ඉඩම් සහ ගොඩනැගිලි කුලියට ගැනීම | 525 | 302 |
| 3 වන කොටස - | රාජකාරි දුරකථන | 527 | 304 |
| 4 වන කොටස - | පුවත්පත් මිලට ගැනීම | 540 | 310 |
| 5 වන කොටස - | රාජ්‍ය ත්‍යාග | 541 | 312 |
| 6 වන කොටස - | පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ඇප | 546 | 313 |
| 7 වන කොටස - | වත්කම් ලේඛණ පවත්වා ගැනීම | 560 | 319 |
| 8 වන කොටස - | වෙනත් | 562 | 320 |

**උපලේඛණ**

ප්‍රධාන ලේකම් කාර්යාලයේ දෙපාර්තමේන්තුවල කාර්යභාරයන්

| | | |
|---|---|---|
| 1 වන උපලේඛණය | අයවැය දෙපාර්තමේන්තුව | 323 |
| 2 වන උපලේඛණය | ආදායම් දෙපාර්තමේන්තුව | 323 |
| 3 වන උපලේඛණය | ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව | 324 |
| 4 වන උපලේඛණය | මුදල් දෙපාර්තමේන්තුව | 324 |
| 5 වන උපලේඛණය | සැලසුම් දෙපාර්තමේන්තුව | 325 |

**පරිශිෂ්ඨාවලිය**

| | | |
|---|---|---|
| පරිශිෂ්ඨය 1 | ප්‍රමිත කරන ලද වැය විෂයයන් | 329 |
| පරිශිෂ්ඨය 2.1 | කාර්ය මණ්ඩල යෝජනා - වාර්ෂික ඇස්තමේන්තුවල ඇතුළත් කිරීම සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහ මු.රෙ.71 යටතේ ඇති කිරීම | 333 |
| පරිශිෂ්ඨය 2.2 | අහෝසි වූ තනතුරක් නැවත ඇති කිරීම සඳහා ඉල්ලීම. | 338 |
| පරිශිෂ්ඨය 2.3 | නව කාර්ය මණ්ඩල යෝජනා | 340 |
| පරිශිෂ්ඨය 3 | මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු තුලනාත්මක ප්‍රකාශ. | 344 |
| පරිශිෂ්ඨය 4 | පරිපූරක ඇස්තමේන්තු යෝජනාවක ආදර්ශය | 345 |
| පරිශිෂ්ඨය 5 | නොගෙවූ වැටුප් පිළිබඳ ලැයිස්තුව | 347 |
| පරිශිෂ්ඨය 6 | නොගෙවූ වැටුප් ලේඛනය | 348 |
| පරිශිෂ්ඨය 7 | වානිජ අත්තිකාරම් ගිණුම් පිලිබඳ ත්‍රෛයිමාසික ප්‍රකාශන සඳහා ආකෘති පත්‍රය | 349 |

| | | |
|---|---|---|
| පරිශිෂ්ඨය 8 | කල්පිත ශාස්තු විෂයයන් | 352 |
| පරිශිෂ්ඨය 8(අ) | අත්තිකාරම් ගිණුම් වසා දැමීම<br>(අ) වත්කම් උපලබ්ධි ප්‍රකාශ පිළිබඳ ආදර්ශ ආකෘතිය | 353 |
| පරිශිෂ්ඨය 8(ආ) | (ආ) බැරකම් පියවීම් පිළිබඳ ප්‍රකාශය සඳහා ආදර්ශ ආකෘතිය | 354 |
| පරිශිෂ්ඨය 8(ඇ) | (ඇ) ලාභ හා අලාභ (ගැලපුම්) ගිණුම සඳහා ආදර්ශ ආකෘති පත්‍රය | 355 |
| පරිශිෂ්ඨය 8(ඈ) | (ඈ) ලැබීම් හා ගෙවීම් ගිණුම සඳහා ආදර්ශ ආකෘතිය | 356 |
| පරිශිෂ්ඨය 9(අ) | රාජකාරි දුරකථන ලේඛණය | 357 |
| පරිශිෂ්ඨය 9(ආ) | දුරකථන ඇමතුම් ලේඛණය | 358 |
| පරිශිෂ්ඨය 10(අ) | ( අ ) ඉඩම් ලේඛණය | 359 |
| පරිශිෂ්ඨය 10ආ) | ( ආ) ගොඩනැගිලි ලේඛණය | 360 |
| පරිශිෂ්ඨය 10(ඇ) | ( ඇ ) වාහන ලේඛණය | 361 |
| පරිශිෂ්ඨය 10(ඈ) | (ඈ) යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලේඛණය | 362 |
| පරිශිෂ්ඨය 10(ඉ) | ( ඉ ) සවි කිරීම් පිළිබඳ ලේඛණය | 363 |
| පරිශිෂ්ඨය 10(ඊ) | (ඊ) ආයෝජන ලේඛණය | 364 |

සූචිය 367

# පෙරවදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ වගන්තියෙන්ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2(1) හා (2) වගන්තිවලින්ද, 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම්වරු සඳහා බලය පැවරීමේ පනතේ 3(2) දරන වගන්තියේද , මවෙත පැවරී ඇති බලතල හා කාර්යභාරයන්ද සැලකිල්ලට ගෙන, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) හා 20(3) වගන්ති අනුව මෙම පළාත් මූල්‍ය රීති පනවනු ලැබේ.

2008 ජනවාරි මස 01 දින සිට මෙම රීති වයඹ පළාත් සභාව සඳහා බලාත්මකවේ. 1988.05.05 දින සිට බලාත්මක කරන ලද පළාත් සභා මුදල් රෙගුලාසි සංග්‍රහයද, එමගින් වලංගු කරන ලද රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසිද, එම පළාත් සභා මුදල් රෙගුලාසි සංග්‍රහයේ නියෝග වලට හා රජයේ මුදල් රෙගුලාසි වලට කරන ලද සියළු සංශෝධනද, එම නියෝග හා රෙගුලාසිවල කරුණුවලට අදාලව නිකුත් කරන ලද චක්‍රලේඛ, උපදෙස් හා මගපෙන්වීම්ද අභිබවා, මෙම පළාත් මූල්‍ය රීති බලාත්මක වන්නේය.

පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාලවලද, ආයතන වලද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද, විධිමත්ව අනුමත කරන ලද රීති නොමැති, ප්‍රඥප්ති මගින් පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතන වලද, පළාත් සභා මූල්‍යමය කාර්යයන් පිළිබඳ කටයුතු කරන සියළුම නිලධාරීන් මෙම රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී. එබැවින් එම සියළු නිලධාරීන්ට මෙම රීති පිළිබඳව මනා දැනීමක් ලබාගත යුතුයැයි මෙයින් නියම කරනු ලැබේ.

මෙම රීති ක්‍රියාත්මක වීමෙන් පසු රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ වෙන යම් ආයතනයන්, මෙම රීතිවල අදාල කරුණු වෙනුවෙන් නිකුත් කරන ලද කවර චක්‍රලේඛයක් , මග පෙන්වීමක් හෝ උපදේශයක් පළාත් සභාව සඳහා වලංගු කර ගැනීමට අවශ්‍යවන්නේ නම් ඒ සඳහා ප්‍රධාන ලේකම්වරයා මගින් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

මෙම රීති පනවනු ලබන්නේ අපේක්ෂිත කාර්යභාරයන් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහාද, යහ පාලනයට අනුකූලව උපරිම අවංක භාවයෙන් හා විනිවිදභාවයෙන් යුතුවීම සඳහාද වන බව සියළුම නිලධාරීන් අවබෝධකර කටයුතු කළයුතුය.

තිස්ස ආර් බලල්ල

වයඹ පළාත් ආණ්ඩුකාරවර

2007 දෙසැම්බර් මස 20 දින,

කුරුණෑගලදීය.

# අධිකාර් බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) හා 20(3) වගන්ති යටතේ පළාත් සභා අරමුදල සඳහා මා වෙත පැවරී ඇති බලය යටතේ මෙම පළාත් මූල්‍ය රීති පනවනු ලැබේ. මෙම රීතින් 2008 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වේ. මෙයට පෙර 1988.05.05 දින සිට බලාත්මක වන පරිදි පනවනු ලැබූ නියෝග හා ඉන් පසු එයට අදාළව නිකුත් කරනු ලැබූ සංශෝධනද, රජයේ මුදල් රෙගුලාසිද, අභිබවා මෙම නව පළාත් මූල්‍ය රීති බලාත්මක වේ.

පළාත් සභාවේ සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහාද, ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය, සභා කාර්යාලය, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා සමූපකාර සේවා කොමිෂන් සභාව සඳහාද, ඉටු කරනු ලබන පළාත් සභා කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහාද, මෙම පළාත් මූල්‍ය රීති අදාල වේ. එසේම පළාත් සභා ප්‍රඥප්ති මඟින් පිහිටුවා ඇති අධිකාර් හා ආයතන, මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ස්වකීය රෙගුලාසි සහ කාර්ය පර්පාටීන් විධිමත් පරිදි අනුමත කර නොමැති නම්, ඒතාක් දුරට එම අධිකාර් හා ආයතන සඳහාද මෙම පළාත් මූල්‍ය රීති අදාළ වේ.

තිස්ස ආර් බලල්ල
වයඹ පළාත් ආණ්ඩුකාරවර

2007 දෙසැම්බර් මස 20 දින
කුරුණෑගලදීය.

# I වැනි පරිච්ඡේදය

## වියදම් හා ආදායම් ඇස්තමේන්තු


| | | පිටුව |
|---|---|---|
| 1 වැනි කොටස | වයඹ පළාතේ පළාත් සභා අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩසටහන් ගතකිරීම | 3 |
| 2 වැනි කොටස | වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම | 16 |
| 3 වැනි කොටස | වාර්ෂික මුදල් ප්‍රකා..ය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | 32 |
| 4 වැනි කොටස | වියදම් ඇස්තමේන්තුවල වෙනසක් කිරීම | 35 |
| 5 වැනි කොටස | ආදායම් ඇස්තමේන්තු | 47 |

# I වැනි පරිච්ඡේදය

## වියදම් හා ආදායම් ඇස්තමේන්තු

### 1 වැනි කොටස

### වයඹ පළාතේ පළාත් සභා අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩසටහන් ගත කිරීම

**ප.මූ.රී.1 මුදල් වර්ෂය**

වයඹ පළාතේ පළාත් සභාවේ මුදල් වර්ෂය එක් එක් අවුරුද්දේ ජනවාරි මස 01 වන දින ආරම්භව එම අවුරුද්දේ දෙසැම්බර් මස 31 වන දින අවසන්වනු ඇත.

**ප.මූ.රී.2 පළාත් සභා මූල්‍ය පාලනය හා කළමනාකරණයට අදාල 1987 අංක 42 දරන පනතේ විධිවිධාන**

2.1 පළාත සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත අනුව පළාත් සභා අරමුදලක් තිබිය යුතුය. එකී පනතේ 19 වන වගන්තිය පහත උපුටා දක්වනු ලැබේ.

"19 (1) එක් එක් පළාත සඳහා පළාත් සභා අරමුදලක් විය යුතුය.

(අ) ඒ පළාතේ පළාත් සභාව විසින් පනවන ලද සියළු බදු වලින් ලැබෙන මුදල්,

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ පළාත සම්බන්ධයෙන් ඒ පළාත් සභාවට කරන ලද සියළු ප්‍රදානයන්හි මුදල්,

(ඇ) ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියළු ණය මුදල් සහ

(ඇ) පළාත් සභාවේ වෙනත් සියළු ලැබීම් ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(2) පළාතක පළාත් සභා අරමුදලින් කිසිම මුදලක්, මේ පනතට අනුකූලවද මේ පනතේ විධිවිධාන සලසා ඇති කාර්ය සඳහාද, ආකාරයෙන්ද හැර ප්‍රයෝජනයට නොගත යුතුය.

(3) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයක් යටතේ හැර, පළාතක පළාත් සභා අරමුදලින් කිසිම මුදලක් ඉවත් කර නොගත යුතුය.

(4) පළාතේ පළාත් සභා අරමුදලින් යම් මුදලක් ඉවත් කර ගැනීමේදී, ඒ මුදල අරමුදලින් ඉවත් කර ගන්නා වූ මුදල් වර්ෂය වෙනුවෙන් සේවාවන් සඳහා පළාත් සභාවේ ප්‍රඥප්තියක් මඟින් ඒ මුදල වෙන්කර දී ඇත්නම් මිස, නැතහොත් ඒ මුදල වෙනය් ආකාරයකින් නිත්‍යානුකූලව පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් කරනු ලැබුවහොත් මිස, එවැනි බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(5) පළාතක පළාත් සභා අරමුදලේ භාරය , ඒ අරමුදලට මුදල් ගෙවීම, සහ ඒ කාරණාවලට සම්බන්ධ හෝ අනුයාත වෙනත් සියලු කරුණු ආණ්ඩුකාරවරයා විසින් සාදනු ලබන රීති මඟින් විධිමත් කරනු ලැබිය යුතුය. "

## 2.2 වාර්ෂික මුදල් ප්‍රකාශය

පළාත් සභා පනතේ 25 සහ 26 වගන්තිවලට හා මෙහි දැක්වෙන රීතිවලට අනුකූලව "වාර්ෂික මුදල් ප්‍රකාශය" නම් වූ ලැබීම් හා වියදම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් සකස් කිරීම ප්‍රධාන ලේකම්වරයාගේ වගකීම වන්නේය .

පළාත් සභා පනතේ එම 25 සහ 26 ඡේද (1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනත මගින් කරන ලද සංශෝධනය ද සමග) මෙහි උපුටා දක්වනු ලැබේ.

"25 (1) පළාතක ආණ්ඩුකාරවරයා විසින් සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන්ම, ඒ මුදල් වර්ෂය ආරම්භ වීමට යටත් පිරිසෙයින් මාස තුනකට පෙර මේ කොටසෙහි "වාර්ෂික මුදල් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන ඒ වර්ෂය සඳහා පළාතේ ඇස්තමේන්තු කළ ලැබීම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක්, ඒ පළාතේ පළාත් සභාව ඉදිරියේ තබනු ලැබීමට සැලැස්විය යුතුය

(2) වාර්ෂික මුදල් ප්‍රකාශයේ අන්තර්ගත වියදම් ඇස්තමේන්තුවලින් -

(අ) පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් විය යුතු වියදම් ලෙස මේ පනතින් විස්තර කර ඇති වියදම් දැරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන්; සහ

(ආ) පළාතේ පළාත් සභා අරමුදලින් කිරීමට යෝජිත වෙනත් වියදම් දැරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන්,

වෙන වෙනම පෙන්වා තිබිය යුතු අතර, ආදායම් ගිණුම මත වියදම් වෙනත් වියදම් වලින් වෙන් කොට දැක්විය යුතුය.

(3) මෙහි පහත දැක්වෙන වියදම් පළාතක පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදම් වන්නේය.

(අ) ආණ්ඩුකාරවරයාගේ පාර්ශ්‍රමික සහ දීමනා;

(ආ) ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින්, පළාත් සඳහා දෙන ලද ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලී, ක්‍රමක්ෂය ගෙවීම්ද ඇතුළු අයකිරීම් සහ ඒ හා සම්බන්ධ වෙනත් වියදම්;

(ඇ) පළාත් සභාවේ සභාපතිවරයාගේ සහ නියෝජ්‍ය සභාපතිවරයාගේ වැටුප් සහ දීමනා;

(ඈ) පළාත් සභාවට විරුද්ධව කවර හෝ අධිකරණයක් හෝ බේරුම්කාර විනිශ්චය අධිකාරයක් විසින් දෙන ලද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ තීරණයක් ඉටු කිරීම පිණිස අවශ්‍ය යම් මුදල් ප්‍රමාණ;

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියකින් හෝ පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්තියකින් හෝ එසේ වැය බරක් විය යුතුයැයි ප්‍රකාශිත වෙනත් කවර හෝ වියදම්."

1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත මගින් පහත පරිදි වූ වියදම්ද පළාත් සභා අරමුදලට වැය බරක් කර ඇත.

"පළාතක ප්‍රධාන අමාත්‍යවරයාට, පළාත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකුට සහ පළාතක් සඳහා පිහිටුවා ඇති පළාත් සභාවක මන්ත්‍රීවරයෙකුට මේ පනත යටතේ ගෙවිය යුතු වැටුප් සහ දීමනා ඒ පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් වන්නේය"